කැලණිය ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 03 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් රු.1,888,786 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ii) | ණයගැති හා ණයහිමි ගිණුම් රු.130,215,203 ක් වැඩියෙන් දක්වා තිබුණි | නිවැරදි වටිනාකම් ගිණුම්ගතකළ යුතු වේ. | 2019 වසරේ අවසාන ගිණුම සකස් කිරීමේ දී ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ගිණුම් විෂයයන් 16 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.443,089,709 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 **<u>අනුකූල නොවීම්</u>**

1.4.1 **<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) | මුදල් රෙගුලාසි 396 | මාස 06 ඉක්ම වූ රු.282,945 ක චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අනෙකුත් චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කරන අතර අවලංගු කර නැවත නිකුත් කරන ලද චෙක්පත් 2019 අප්‍රේල් 30 වන විට නිශ්කාශනය වී ඇති බව දන්වමි. |
| (ආ) | 2012 ජනවාරි 03 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 ඡේදය | ප්‍රජා පාදක සංවිධාන වෙත කොන්ත්‍රාත්තු පැවරීමේදී අදාළ සුදුසුකම් පරීක්ෂා නොකර ව්‍යාපෘති 30ක් පවරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් අප සභාවට ලැබුණු බැවින්ද, සීමිත සමිති සංඛ්‍යාවක් ලියාපදිංචි වී තිබු බැවින් ප්‍රජා මණ්ඩල වලට ව්‍යාපෘති ලබා දීමට තීරණය කරන ලදී. |

2 **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,491,106 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.68,430,011 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් දක්වා පැවත එන රු.1,197,593 ක අගරු චෙක්පත් 24 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළයුතු වේ. | මේ පිළිබඳ තොරතුරු වැඩි දුරටත් සොයා බලා පෙන්වා දී ඇති කරුණ 2019 වසරේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 55,501,000 | 58,828,222 | 58,149,428 | 24,509,950 | 53,550,000 | 54,958,058 | 62,275,053 | 25,212,921 |
| කුලී | 20,672,596 | 22,208,754 | 21,293,547 | 6,197,573 | 19,717,347 | 22,671,017 | 23,325,061 | 5,127,727 |
| බලපත්‍ර ගාස්තු | 1,801,000 | 1,858,368 | 1,858,368 | - | 1,552,500 | 1,829,128 | 1,829,128 | 359,566 |
| වෙනත් ආදායම් | 151,025,250 | 187,926,315 | 187,926,315 | - | 127,765,500 | 93,240,090 | 93,252,089 | - |

2.3.2 **<u>වරිපනම් හා බදු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ලබාදී තිබූ වරිපනම් හිඟ ශේෂයේ කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 1- 3 අතර රු.7,521,186 ක් ද, වර්ෂ 3 – 5 අතර 5,738,965 ක් ද, වර්ෂ 5 – 10 අතර 9,517,119 ක් ද පැවති අතර වර්ෂ 10 ට වැඩි 4,152,053 ක හිඟ ශේෂ පැවතුණි. | දිගු කාලීන හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | සමීක්ෂණයක් සිදු කොට තත්‍ය වශයෙන් නොපවතින දේපළ වලට අදාළ හිඟය නෛතිකව කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2009 වර්ෂයෙන් පසුව වරිපනම් නැවත තක්සේරුකර නොතිබුණි. | වරිපනම් නව තක්සේරු කඩිනමින් කළයුතු වේ. | තක්සේරු ප්‍රතිශෝධනයට අදාළ තක්සේරුව සිදු කර දීමට කටයුතු කර නොමැති බවත්, අඛණ්ඩව සිහි කැඳවීම් කරන බවත් දන්වමි. |

2.2.3 කඩකුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 76 කින් අයවිය යුතු හිඟ කඩ කුලිය රු.2,227,286 ක් විය. කඩ කාමර 103 ක් සඳහා ලිඛිත ගිවිසුම් නොතිබූ අතර ගිවිසුම් රහිතව කුලියට දී තිබූ කඩ කාමර 36 කින් අයවියයුතු හිඟ කඩ කුලිය රු.1,078,327 ක් විය. | අයවිය යුතු හිඟ කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර ඇත. තවද ගිවිසුම් කාලය අවසන්ව ඇති කඩ සඳහා නව තක්සේරු වාර්තා ලබාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

2.3.4 <u>වෙනත් ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභා බල ප්‍රදේශය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 64 ක් ඉදිකර තිබුණ අතර 2018 වර්ෂයේදී බලපත්‍ර ගාස්තු ලෙස රු.3,000 බැගින් රු.75,000 ක ආදායමක් රැස්කරගෙන තිබුණි.අනෙකුත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් බලපත්‍ර ගාස්තු අයකිරීමට හෝ එම කුළුණු අක්‍රිය බවට වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | සියළුම සම්ප්‍රේෂණ කුළුණු වලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට කුළුණු ආදායම් අයකරගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් පවතින අතර, බලප්‍රදේශය තුළ කුළුණු හඳුනා ගැනීමේ සමීක්ෂණයක් ද සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) සභා බල ප්‍රදේශයට අයත් සම්ප්‍රේෂණ කුළුණු 64 ක් තිබුණත් එම කුළුණු 64 වාර්ෂික තක්සේරුව මත වරිපනම් ආදායම් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර සියළු කුළුණු හඳුනාගැනීමක් කළයුතු වේ. | වරිපනම් තක්සේරු කටයුතු සිදු කරමින් පවති. |

3. <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

3.1 <u>**කාර්ය සාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>**අතුරු ව්‍යවස්ථා**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 26 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ වැළඳගැනීම කළයුතු වේ. | අවශ්‍යතාවය පරිදි ඉදිරියේ දී අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 05 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර නොතිබුණි. | ඉටුකළයුතු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළයුතු වේ. | එම අතුරු ව්‍යවස්ථා අප සභා බල ප්‍රදේශයට බල නොපාන කරුණු සම්බන්ධයෙන් වන බව දන්වමි. |

(ඇ) <u>අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබානොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැලණිය බස් නැවතුම්පල කඩ කාමර ඉදිකිරීම වෙනුවෙන් සභා අරමුදලෙන් රු.27,985,429 ක් වැයකර තිබුණි. මෙම ඉදිකිරීම් සිදුකරන ලද භූමියේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර නොගෙන ඉදිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට අත්පත් කරගත හැකිව තිබූ ප්‍රතිලාභ අහිමිවී තිබුණි. | සිදුකරන ලද වියදම් වෙනුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | වාචික අනුමැතිය ලබා දීමෙන් පසු අදාළ ගොඩනැගිල්ල පිහිටි භූමිය බලයලත් මිනින්දෝරුවෙකු ලවා මේ වන විට මිණුම් කටයුතු කර ඇත. |

(ඈ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කසළ අපහරණය හා කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් සහ කසළ බදු පැනවීමක්ද සිදුකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට හා කසළ බදු අය කිරීමට කටයුතු කළයුතු වේ. | 2018 ඔක්තෝම්බර් මස සිට කසල ගාස්තු අය කිරීම ආරම්භ කර ඇති බවද දන්වමි. |
| (ii) | කසළ බැහැර කරන භූමියට විගණිත දිනය වන 2019 මැයි 07 දින වන විටත් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර ඇතත්, මේ දක්වා පරිසර බලපත්‍රය නිකුත් කර නොමැති බව දන්වමි. |

3.2 <u>මහජන පැමිණිලි</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මහජන පැමිණිලි 168 කින් පැමිණිලි 115 ක් පමණ විසඳා තිබූ අතර 20 ක් පරීක්ෂණ මට්ටමේ පැවති අතර 22 ක් නොවිසඳී පැවතුණි. | මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ඒ සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

3.3 <u>වත්කම් කළමනාකරණය</u>

<u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ----------------------------------- |
| (අ) | සමීක්ෂණය මගින් සභාවට අයත් ලෙස හඳුනාගත් ඉඩම් හා ගොඩනැගිලි 57 ක් අතුරින් ඔප්පු නොමැති ඉඩම් සංඛ්‍යාව 43 ක් විය. ඇතැම් දේපල සඳහා සැලසුම පමණක් තිබූ අතර දේපල 5 ක් සඳහා කිසිදු ලියවිල්ලක් නොතිබුණි. | සභාව සතු වත්කම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. විශේෂ ආකෘති පත්‍රයක් යටතේ තොරතුරු රැස් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ඉඩම් වලින් ඉඩම් 25 ක වටිනාකම් සඳහන්ව නොතිබුණි. | වත්කම්වල වටිනාකම තහවුරු කර ගිණුම්ගත කළයුතු වේ. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් වටිනාකම් නිවැරදිව දැන ගැනීම පිණිස තක්සේරු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4 <u>**පවරා නොගත් වත්කම්**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | ------------------------------------ |
| වාහනයක් හා විවිධ ආයතනවලින් ලද රු.13,322,320 ක් වටිනා වාහන 4 ක් 2019 මැයි 08 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පෙන්වා දී ඇති වාහන අප සභාව වෙත පවරා ගැනීමට අදාළ කටයුතු කරමින් පවතී. |

3.5 <u>**භාණ්ඩ සමීක්ෂණය**</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ------------------------------------ |
| (අ) | ගුරුන්නාන්සේගේවත්ත නිවාස ක්‍රමයේ පැවති ක්‍රීඩා පිටිය හා ළමා උයන නොතිබූ අතර එහි බුදු පිළිමයක් ඉදිකර තිබුණි. වනවාසල ක්‍රීඩාපිටිය භූමියද මේ වන විට දක්නට නොතිබුණි. | සභාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළයුතු වේ. | තවද සභාව සතු ලෙස තහවුරු කර ගන්නා ලද ඉඩම්වල වැට මායිම් යොදා ආරක්ෂාව තහවුරු කොට නාම පුවරු සවි කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | පුස්තකාල 11 ක ප්‍රයෝජනයට ගත නොහැකි පොත් 1265 ක් හා සමීක්ෂණයට ඉදිරිපත් නොකළ පොත් 1518 ක් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | පෙන්වා දී ඇති පොත් සභාව වෙත ගෙන්වා ගැනීමට මේ වන විට කටයුතු යොදා ඇති අතර, කඩිනමින් භාණ්ඩ අපහරණ මණ්ඩලයක් පත් කොට ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

3.6 <u>ආර්ථික නොවූ ගණුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉදිකරන ලද පාරවල් 44 කොන්ක්‍රීට් කුට්ටිගල් සාම්පල් පරීක්ෂාව සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී රු.364,512 ක් ගෙවා තිබුණි. එහෙත් මෙම පරීක්ෂාවට ඉදිරිපත් කරන ලද කුට්ටිගල් අදාල මාර්ග වලට අතුරන ලද කුට්ටිගල් නියෝජනය නොවන වෙනත් සාම්පල් බව භෞතික පරීක්ෂාවේදී තහවුරු විය. | වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | විගණනය විසින් පෙන්වා දෙන ලදුව අසමත් වූ කුට්ටිගල් සහිත පාරවල් නැවත නිවැරදිව සකස් කරමින් පවතින අතර, ඒ සඳහා ගල් පරීක්ෂාවට යොමු කිරීමේ දී කොන්ත්‍රාත්කරුට අදාළ ගෙවීම නොකරන බවත් අදාළ පාරවල් සියල්ල නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන බවත් කාරුණිකව දන්වමි. |

3.7 <u>සැපයීම් හා සේවා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 පෙබරවාරි 09 දින රු.4,476,950 කට වායු සමීකරණ යන්ත්‍ර 14 ක් සිංගර් ශ්‍රී ලංකා ආයතනයෙන් මිලදී ගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9(ආ) ඡේදය අනුව ආයතනය සමග ගිවිසුමක් අත්සන්කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. දැනට ගිවිසුම්ගත වීමට දැනුම්දෙන ලදුව ගිවිසුම ලබාගත් වහාම පිටපතක් එවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 වර්ෂයේ විදුලි බල්බ 5,000 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ප්‍රකාරව ලංසු, තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9(ආ) ප්‍රකාරව අදාල ආයතනය සමග ගිවිසුම්ගත වීමක් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 2018 වර්ෂයේ බල්බ 5000 ක් මිලදී ගෙන ඇති බැවින් මේ දක්වා බල්බ මිලදී නොගත් අතර දැනට තාක්ෂණ කමිටු නිර්දේශ මත තේරී පත්ව ඇති සැපයුම් කරු සමඟ ගිවිසුම් ගත වීමට කටයුතු කරන බව දන්වමි. |

3.8 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් රු.28,360,551 ක් වැයකර මාර්ග 44 ක කොන්ක්‍රීට් කුට්ටිගල් ඇල්ලීමේදී යොදාගන්නා ලද කුට්ටිගල්වල සම්පීඩන ශක්තිය සම්බන්ධයෙන් සිදුකරන ලද සාම්පල් පරීක්ෂාවේදී ගල් 21 කින් ගල් 14 ක සම්පීඩන ශක්තිය අපේක්ෂිත ප්‍රමාණයට වඩා පහල අගයක් ගන්නා බව තහවුරුකර තිබුණි. | ඉදිකිරීම් සිදු කිරීමේදී අපේක්ෂිත සම්පීඩන ශක්තිය පරීක්ෂණ වාර්තා වලින් තහවුරු කරගත යුතු වේ. | විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව සම්පිණ්ඩන ශක්තියෙන් අඩු කුට්ටිගල් සවි කරන ලද පාරවල් නැවත නිවැරදි කරමින් පවතින බව දන්වමි. |